# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1663/18 - 2010 ජූලි 22 වැනි බ්‍රහස්පතින්දා - 2010.07.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

සබරගමුව පළාතේ පළාත් සභාව

2010 අංක 02 දරන සබරගමුව පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය

සහතිකය සටහන් කළේ - 2010.05.06
අනුමැතිය ලැබුණේ - 2010.07.07

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදි,

ශ්‍රියානි පද්මලතා,
සභා ලේකම් (වැ.බ.),
සබරගමුව පළාතේ පළාත් සභාව.

...0 ජූලි මස 14 වැනි දින,
සබරගමුව පළාතේ පළාත් සභාවේ දී ය.

සබරගමුව පළාතේ පළාත් සභාව.

2010 අංක 02 දරන සබරගමුව පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය

*සබරගමුව පළාතේ පෙර පාසල් කළමනාකරණය සහ අධීක්ෂණය මගින් සබරගමුව පළාත තුළ පෙර පාසල් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහාද ඊ හා සම්බන්ධ හා ඊට අනුෂංගික කරුණු සඳහාද විධිවිධාන සැලසීම පිණිස වූ ප්‍රඥප්තියකි*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මෙම ප්‍රඥප්තිය "2010 අංක 02 දරන සබරගමුව පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන අතර එය ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබෙන දිනයේ සිට ක්‍රියාත්මකවිය යුතු ය. *(ලුහුඬු නාමය හා ක්‍රියාත්මකවීමේ දිනය.)*

1A - PG 001161 — 335 (2010/07)

## I වැනි කොටස

### සබරගමුව පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය පිහිටුවීම

සබරගමුව පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය පිහිටුවීම.

02. (1) (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් හඳුන්වනු ලබන) සබරගමුව පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අධිකාරිය (1) වැනි උපවගන්තිය යටතේ එයට පවරා ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් අධිකාරිය විසින් නඩු පැවරීම ද එයට එරෙහිව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

අධිකාරියේ අරමුණු

03. පහත දැක්වෙන අරමුණු අධිකාරියට ඇත්තේ ය :–

(අ) පළාත ඇතුලත පූර්ව ළමා අධ්‍යාපනය අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම මගින් පළාත තුල ළමා අධ්‍යාපනය දියුණු කිරීම;

(ආ) පළාතේ ළමුන්ගේ අධ්‍යාපන, සමාජයීය සහ අධ්‍යාත්මික සංවර්ධනය සඳහා උචිත පරිසර නිර්මාණය කිරීම.

අධිකාරියේ කර්තව්‍ය

04. අධිකාරියට පහත සඳහන් කර්තව්‍ය ඇත්තේ ය :–

(අ) පළාත තුල ළමා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය උපදෙස්, මඟ පෙන්වීම සහ සහාය ලබාදීම;

(ආ) පෙර පාසල් පාලක, පාලිකාවන් පුහුණු කිරීම ;

(ඇ) පළාත තුල පිහිටුවා ඇති සහ පවත්වාගෙන යනු ලබන සියලු පෙර පාසල් ලියාපදිංචි කිරීම ;

(ඈ) පෙර පාසල් සිසුන්ගෙන් ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් කොන්දේසි පැනවීම ;

(ඉ) පෙර පාසල් පාලක, පාලිකාවන්ගේ අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳව නියමයන් පැනවීම ;

(ඊ) පෙර පාසල් පාලක, පාලිකාවන් පුහුණු කිරීම සඳහා ගුරු පුහුණු ආයතන පිහිටුවා පවත්වාගෙන යාම සහ සහතික පත්‍ර ප්‍රදානය කිරීම ;

(උ) පෙර පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සම්බන්ධයෙන් වූ ප්‍රමිති නියම කිරීම ;

(ඌ) පෙර පාසල් නවීකරණය කිරීම හා සම්බන්ධව සේවාස්ථ සැසි පැවැත්වීම ;

(එ) පළාත් පාලන ආයතන ද ඇතුලුව වෙනත් සංවිධාන විසින් පවත්වනු ලබන පෙර පාසල්වල කළමනාකරණය සහ පාලනය සම්බන්ධයෙන් වූ ප්‍රමිතීන් නියම කිරීම ;

(ඒ) පූර්ව ළමා සංවර්ධනයේ වැදගත්කම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම ;

(ඔ) පළාතේ ළමුන්ගේ සාමාජයීය, මානසික සහ අධ්‍යාත්මික සංවර්ධනය සඳහා අවශ්‍යවන්නා වූ ක්‍රියාකාරකම් සිදුකිරීම සහ එවැනි ක්‍රියාකාරකම් හා සම්බන්ධවී සිටින වෙනත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධීකරණය වීම;

(ඕ) පළාතේ ළමුන්ගේ සංවර්ධනය වෙනුවෙන් ක්‍රියාකරන රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම;

(ක) පළාතේ ඕනෑම ස්ථානයක (වතුද ඇතුළුව) ළමා සංවර්ධනය සඳහා පවත්වාගෙන යාමට නියමිත අධිකාරිය විසින් සංවිධානය කරනු ලබන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ කොන්දේසි පැනවීම ;

(ඛ) ආදර්ශ පෙර පාසල් පවත්වාගෙන යාම, පාලක පාලිකාවන්ගේ සුබසාධනය සඳහා අදාල විධිවිධාන සැලැස්වීම ;

05. පහත සඳහන් බලතල අධිකාරියට ඇත්තේය :– අධිකාරියේ බලතල

(අ) යම් වංචල හෝ නිශ්චල දේපලක් යම් ආකාරයකින් අත්කර ගැනීම සහ දැරීම, බදුදීම හෝ කුලියට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම ;

(ආ) අධිකාරිය විසින් සලසනු ලබන ලද යම් සේවාවක් සඳහා වූ ගාස්තු හෝ මුදල් අය කිරීම ;

(ඇ) මුදලින් හෝ අන්‍යාකාරයකින් ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග භාරගැනීම සහ ස්වකීය කර්තව්‍ය ඉටුකිරීම සඳහා ඒවා යොදාගැනීම ;

(ඈ) අධිකාරියේ කටයුතු ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවකයන් පත්කිරීම ;

(ඉ) එසේ පත්කරගත් නිලධරයන් සහ සේවකයන් සඳහා ගෙවිය යුතු පාරිශ්‍රමික තීරණය කිරීම ;

(ඊ) අධිකාරියේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(උ) අධිකාරියේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් වූ රීති සෑදීම ;

(ඌ) පළාතේ පිහිටුවා ඇති ලියාපදිංචි ළමා නිවාස සහ ආබාධිත ළමයින් සඳහා වූ නිවාස සම්බන්ධයෙන් පූර්ව ළමා සංවර්ධනය ක්‍රියාත්මකවීම අධීක්ෂණය කිරීම ;

(එ) අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය හෝ අනුෂංගික හෝ නියමිත වෙනත් සියලු දේ සිදුකිරීම.

06. (1) අධිකාරියේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් වෙත පවරාදෙනු ලැබිය යුතුය :– අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම.

(අ) පහත දැක්වෙන නිලබලයෙන් පත්වන සාමාජිකයන්, එනම් :–

(I) මණ්ඩලයේ සභාපති විය යුතු අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;
(II) පළාත් සමාජසේවා අධ්‍යක්ෂවරයා ;
(III) නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරයා (සැලසුම්) ;
(IV) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ;
(V) පළාත් පාලන කොමසාරිස්වරයා ;
(VI) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා සහ
(VII) පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා.

(ආ) (මෙහි මින්මතු "පත්කල සාමාජිකයින්" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන් :-

(I) අමාත්‍යවරයාට පෙනීයන ආකාරයට ළමා අධ්‍යාපනය පිළිබඳව දැනුමක් හා පළපුරුද්දක් ලබා ඇති රාජ්‍ය අංශයේ යෙදී සිටින තැනැත්තන් නොවන අයගෙන් සාමාජිකයන් දෙදෙනකු ;
(II) අමාත්‍යවරයාට පෙනීයන ආකාරයට ළමා අධ්‍යාපනය පිළිබඳ දැනුමක් හා පළපුරුද්දක් ලබා ඇති රාජ්‍ය අංශයේ එක් සාමාජිකයකු.

07. යම් තැනැත්තෙක් – සාමාජිකයකු ලෙස පත්කිරීම පිළිබඳ නුසුදුසුකම්.

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේනම් හෝ වන්නේ නම් ;

(ආ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ පුරවැසියකු වීම නැවතී ඇත්නම් ;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බව දැනගැනීමට තිබේනම් හෝ ප්‍රකාශයට පත්කරනු ලැබ සිටී නම්,

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් මගින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකට යටත්ව සිටීනම් හෝ යටත්ව සිටියේනම් ;

(ඉ) අධිකාරිය විසින් හෝ අධිකාරිය වෙනුවෙන් ඇතිකරගත් යම් ගිවිසුමක් යටතේ ඔහු යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් දරන්නේනම් හෝ භුක්ති විඳින්නේනම් ; හෝ

(ඊ) අධිකාරියේ සාමාජිකයකු ලෙස සිය කටයුතු ඉටුකිරීමේ දී ඊට බලපෑමක් සිදුවිය හැකි යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවයක් ඔහුට ඇත්නම්

ඒ තැනැත්තා සාමාජිකයකු ලෙස පත්කරනු ලැබීම සඳහා හෝ එලෙස තවදුරටත් කටයුතු කිරීම සඳහා හෝ සුදුස්සකු නොවිය යුතු ය.

පත්කළ සාමාජිකයන් ඉවත් කිරීම සහ ඉල්ලා අස්වීම.

08. (1) මණ්ඩලයේ යම් පත්කළ සාමාජිකයකු විසින් අමාත්‍යවරයා අමතන ලිපියක් මගින් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර එම ලිපිය අමාත්‍යවරයා විසින් භාරගනු ලබන දිනයේ සිට එම ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් හේතු දක්වා මණ්ඩලයේ යම් පත්කල සාමාජිකයකු ධුරයෙන් ඉවත්කරනු ලැබිය හැකි ය.

(3) අධිකාරියේ යම් පත්කළ සාමාජිකයකු මියයන, ඉල්ලා අස්වන හෝ ධුරයෙන් ඉවත්කරනු ලබන අවස්ථාවකදී 6 වැනි වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවට වෙනත් සාමාජිකයකු පත්කරනු ලැබිය යුතු ය.

(4) (3) වැනි උප වගන්තිය යටතේ පත්කළ යම් සාමාජිකයකු තමා අනුප්‍රාප්තිකයා වන සාමාජිකයාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

සාමාජිකයන්ගේ ධුරකාලය.

09. 8 වැනි වගන්තියේ (1) සහ (2) වැනි උපවගන්තිවල විධිවිධානවලට යටත්ව මණ්ඩලයේ යම් පත්කල සාමාජිකයකුගේ ධුරකාලය අවුරුදු තුනක් වියුතු අතර එම සාමාජිකයා නැවත පත්කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික දීමනා.

10. ප්‍රධාන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන අනුප්‍රමාණ සහ සම්මතයෙන් අනතුරුව මණ්ඩලයේ සාමාජිකයන් වෙත පාරිශ්‍රමික හෝ දීමනා ගෙවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම

11. (1) සභාපතිවරයා මණ්ඩලයේ රැස්වීම්වලට පැමිණ සිටීනම් ඔහු ඒ සෑම රැස්වීමකම මූලාසනය දැරිය යුතුය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටීනම් පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත්කරගනු ලබන සාමාජිකයකු එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(2) අධිකාරියේ යම් රැස්වීමක ගණ පූර්ණය සාමාජිකයන් පස්දෙනකු විය යුතු ය.

(3) සභාපතිවරයාට හෝ අධිකාරියේ යම් රැස්වීමක මුලසුන දරන වෙනත් සාමාජිකයකුට තම ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතුය.

පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසා ක්‍රියා අවලංගු නොවිය යුතු බව.

12. මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසා හෝ එහි යම් සාමාජිකයකු පත්කිරීමේ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා අධිකාරියේ යම් ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් අවලංගු ලෙස සලකනු නොලැබිය යුතුය.

අධිකාරියේ මුද්‍රාව.

13. (1) අධිකාරියේ මුද්‍රාව මණ්ඩලය විසින් තීරණය කොට සාදනු ලැබිය යුතු අතර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට එය වෙනස්කරනු ලැබිය හැකිය.

(2) අධිකාරියේ මුද්‍රාව මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන යම් තැනැත්තකුගේ භාරයේ තිබිය යුතුය.

(3) මණ්ඩලයේ අනුමැතිය ඇතිව හැර සහ සභාපතිවරයා සහ එක් සාමාජිකයකු ඉදිරිපිටදී හැර අධිකාරියේ මුද්‍රාව තිබීම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර තමා පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් සභාපතිවරයා සහ එම සාමාජිකයා සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු ය :–

එසේ වුව ද, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට අධිකාරියේ මුද්‍රාව තබනු ලබන විට සභාපතිවරයාට පැමිණ සිටීමට නොහැකිවන අවස්ථාවකදී මේ උපවගන්තියේ ඉහතින්ම වූ විධිවිධානවලට අනුකූලව එම සාධන පත්‍රය හෝ ලේඛනයේ අත්සන් තැබීමට සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරනු ලැබූ වෙනත් යම් සාමාජිකයකුට බලය තිබිය යුතු ය.

(4) අධිකාරියේ මුද්‍රාව තබා ඇති ලේඛන සහ සාධනපත්‍ර පිළිබඳ ලේඛනයක් අධිකාරිය විසින් පවත්වාගෙන යා යුතු ය.

14. මණ්ඩලය විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී හා කර්තව්‍ය ඉටුකිරීමේදී අමාත්‍යවරයා විසින් මණ්ඩලය වෙත කලින්කල නිකුත්කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකල යුතුය. එසේ වුවද, එසේ නිකුත්කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානවලට මණ්ඩලය විසින් අනුකූලව ක්‍රියා කිරීම තත්කාලයෙහි බලපවත්නා වෙනත් යම් නීතියක විධිවිධානවලට යටත්ව සිදුවිය යුතු ය. අමාත්‍යවරයාගේ විධානය යටතේ මණ්ඩලය විසින් සිය බලතල ක්‍රියාත්මක කළයුතු බව.

15. (1) මණ්ඩලය විසින් ස්වකීය බලතල සහ කර්තව්‍යවලින් යම් බලතල සහ කර්තව්‍ය මණ්ඩලයේ සභාපතිවරයා වෙත පවරනු ලැබිය හැකි ය. මණ්ඩලයේ බලතල සහ කර්තව්‍ය පැවරීම.

(2) (1) වැනි උපවගන්තිය යටතේ බලතල සහ කර්තව්‍ය පවරනු ලැබූ සභාපතිවරයා විසින් අධිකාරියේ සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානවලට යටත්ව එසේ පවරනු ලැබූ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම කරනු ලැබිය යුතු ය.

*II වැනි කොටස*

අධිකාරියේ කාර්ය මණ්ඩලය

16. (1) අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතු (මෙහි මින් මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් [කර]නු ලබන) සහ මියයාම, ඉල්ලා අස්වීම හෝ සේවයෙන් ඉවත් කිරීම නිසා කලින් ධුරය හිස් කරන්නේ නම් මිස, [අ]වුරුදු පහක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අධිකාරියේ අධ්‍යක්ෂවරයකු සිටිය යුතුය. ධුරයෙන් ඉවත්කරනු ලැබුවේ [න]ම් මිස අධ්‍යක්ෂවරයා නැවත පත්කිරීම සඳහා සුදුසු විය යුතු ය. අධ්‍යක්ෂවරයා පත් කිරීම.

(2) අධ්‍යක්ෂවරයා, සභාපතිවරයාගේ සාමාන්‍ය සහ විශේෂ විධිවිධානවලට සහ පාලනයට යටත්ව, අධිකාරියේ [කටයු]තු මෙහෙයවීම, අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්ය සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම මෙන්ම [අධි]කාරියේ සේවා නියුක්තිකයන්ගේ පරිපාලනය භාරව සිටිය යුතු ය.

(3) මණ්ඩලයේ අනුමැතිය ඇතිව අධ්‍යක්ෂවරයා විසින් කලින් කල අවශ්‍ය යයි සලකනු ලබන ඔහුගේ යම් [බල]තල, කාර්ය සහ කර්තව්‍ය අධිකාරියේ යම් සේවා නියුක්තිකයකුට ලිඛිතව පවරනු ලැබිය හැකි අතර එසේ බලතල, [කා]ර්ය හෝ කර්තව්‍ය පවරනු ලැබූ යම් සේවා නියුක්තිකයකු විසින් අධ්‍යක්ෂවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානයට [යට]ත්ව එකී බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(4) ප්‍රධාන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික සභා [අරමුද]ලෙන් අනතුරුව අධ්‍යක්ෂවරයා වෙත ගෙවනු ලැබිය හැකි ය.

(5) අමාත්‍යවරයා අමතන ලද ලිපියක් මගින් අධ්‍යක්ෂවරයාට සිය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් භාරගන්නා දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(6) අධ්‍යක්ෂවරයාගේ ධූරයේ පුරප්පාඩුවක් ඇති අවස්ථාවක දී (1) වැනි උප වගන්තිය යටතේ පත්වීමක් සිදුකරන තෙක් මණ්ඩලයේ සාමාජිකයකු අමාත්‍යවරයා විසින් එම අධ්‍යක්ෂ ධූරයේ කාර්ය ඉටු කිරීම සඳහා පත් කරනු ලැබිය හැකි ය.

අධ්‍යක්ෂවරයාගේ සුදුසුකම්.

17. 16 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා ලෙස පත්කරනු ලබන තැනැත්තා –

(අ) උපාධියක් ලබා තිබිය යුතු අතර ළමා අධ්‍යාපන ක්ෂේත්‍රයේ කටයුතු පිළිබඳ වසර 5ක පළපුරුද්දක් තිබිය යුතුය ; හෝ

(ආ) ළමා අධ්‍යාපන ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි පළපුරුද්දක් තිබිය යුතුය ; සහ

(ඇ) ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.

නිලධරයන් සේවකයන් සහ අනුයෝජිතයන් පත්කිරීම.

18. (1) අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ කිරීම සඳහා අවශ්‍යයයි අධිකාරිය විසින් සලකනු ලබන නිලධරයන්, සේවකයන් සහ අනුයෝජිතයන් අධිකාරිය විසින් පත්කරනු ලැබිය හැකි අතර අධිකාරිය විසින් අධිකාරියේ කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය. අධිකාරිය විසින් එකී නිලධරයන්, සේවකයන් සහ අනුයෝජිතයන් පත්කිරීම පිළිබඳ බලතල මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා වෙත පවරනු ලැබිය හැකි ය.

(2) අධිකාරියේ නිලධරයන්, සේවකයන් සහ අනුයෝජිතයන් වෙත අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට සහ අනුප්‍රමාණ අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන සේවා කොන්දේසිවලට ඔවුන් යටත්විය යුතු ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලයට පළාත් රාජ්‍ය නිලධරයන් පත්කිරීම.

19. (1) මණ්ඩලයේ ඉල්ලීම පරිදි පළාත් සභා රාජ්‍ය සේවයේ යම් නිලධරයකු එම නිලධරයාගේ සහ ආණ්ඩුකාරවරයාගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) පළාත් රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) පළාත් රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කරනු ලබන අවස්ථාවකදී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධාන ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාල සීමාවක් සඳහා පළාත් සභාව වෙත සේවය කිරීමට එකඟවී ඇත්තා වූ ද එමගින් පළාත් සභාව සමග ගිවිසුමකට ඇතුළත්වී ඇත්තාවූ ද යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, එම තැනැත්තා විසින් අධිකාරියට කරනු ලබන යම් සේවා කාලයක් ඒ ගිවිසුමේ වගකීම ඉටු කිරීමේ කාර්ය සඳහා පළාත් සභාව වෙත කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## *III වැනි කොටස*

### ප්‍රාදේශීය කළමනාකරණ මණ්ඩල පිහිටුවීම

ප්‍රාදේශීය කළමනාකරණ මණ්ඩල පිහිටුවීම හා එහි සංයුතිය.

20. (1) අධිකාරියේ අරමුණු හා බලතල ක්‍රියාත්මක කිරීමේ පහසුව සඳහා සබරගමුව පළාතේ එක් එක් අධ්‍යාපන කලාපය සඳහා (මෙහි මින්මතු "ප්‍රාදේශීය මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය කළමනාකරණ මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු අතර ඒ එක් එක් ප්‍රාදේශීය මණ්ඩලය පහත තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:–

(ඉ) පහත දැක්වෙන නිල බලයෙන් පත්වන සාමාජිකයන් එනම් –

(I) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහුව නියෝජනය කරනු ලබන යම් අධ්‍යක්ෂවරයකු ;

(II) ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ;

(III) අදාල ප්‍රාදේශීය සභාවල ලේකම්වරු ;

(IV) පරිවාස නිලධරයකු ;

(V) ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීවරයකු ;

(VI) අධ්‍යාපන නිලධරයකු ;

(VII) සමාජසේවා නිලධරයකු ;

(ඈ) (මෙහි මින්මතු "ප්‍රාදේශීය මණ්ඩලවල පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්, එනම් –

(I) අදාල අධ්‍යාපන කලාපයේ පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ව දැනුම සහ පළපුරුද්ද සහිත තැනැත්තකු ;

(II) අදාල අධ්‍යාපන කලාපයේ ලියාපදිංචි පෙර පාසල් පාලක පාලිකාවන් අතරින් තෝරාගත් පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධනය පිළිබඳව අවුරුදු පහක පලපුරුද්දක් සහ දැනුමක් සහිත තැනැත්තන් තිදෙනෙකු ;

(III) අදාල අධ්‍යාපන කලාපයේ පෙර පාසල් ළමුන්ගේ දෙමව්පියන් නියෝජනය කරනු ලබන තැනැත්තන් දෙදෙනෙකු.

(2) එක් එක් අධ්‍යාපන කලාපය සඳහා පිහිටුවනු ලද සෑම ප්‍රාදේශීය කළමනාකරණ මණ්ඩලයක්ම, මණ්ඩලයේ මගපෙන්වීම සහ විධානය යටතේ ක්‍රියාත්මක විය යුතු ය.

(3) ප්‍රාදේශීය කළමනාකරණ මණ්ඩලයේ සභාපති අධිකාරියේ කළමණාකරන මණ්ඩලය මගින් සභාපති පත්කළ යුතු ය.

21. ප්‍රාදේශීය මණ්ඩලවල පත්කළ සාමාජිකයකුවීම සඳහා වූ නුසුදුසුකම්, සේවයෙන් ඉවත්කිරීම සහ සේවයෙන් ඉල්ලා අස්වීම, ධුරකාලය සහ පාරිශ්‍රමික සම්බන්ධයෙන් වූ කාරණා සඳහා ද එක් එක් ප්‍රාදේශීය මණ්ඩල කාර්යක්ෂමව ක්‍රියාකාරිත්වය සඳහා නියමිත වෙනත් කරුණු සම්බන්ධයෙන්ද අධිකාරිය විසින් රීති සාදනු ලැබිය යුතු ය. ප්‍රාදේශීය කළමනාකරණ මණ්ඩල සඳහා අධිකාරිය විසින් රීති සෑදිය හැකි බව.

IV වැනි කොටස

මුදල්

22. (1) (මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "සබරගමුව පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියේම අරමුදලක් අධිකාරියට තිබිය යුතුය. පහත සඳහන් මුදල් එම අරමුදලට බැර කරනු ලැබිය යුතු ය :– අධිකාරියේ අරමුදල.

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පළාත් සභාව විසින් කලින්කල අනුමත කරනු ලැබියහැකි සියලු මුදල්;

(ආ) අධිකාරිය විසින් ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ කිරීමේදී අධිකාරියට ලැබෙන සියලු මුදල්;

*(ඇ)* අධිකාරියට ශ්‍රී ලංකාවේදී හෝ ඉන් පිටතදී කවර වූ හෝ ප්‍රභවයකින් ණය මුදල්, පරිත්‍යාග, ෑ ප්‍රදාන වශයෙන් ලැබෙන සියළු මුදල් ;

*(ඈ)* අධිකාරිය වෙත සතු සර ඇති හෝ අධිකාරිය විසින් පරිපාලනය කරනු ලබන යම් දේපලකින් අ උපචිතවන සියලු ආදායම් ; සහ

*(ඉ)* අධිකාරිය විසින් සපයනු ලබන සේවා වෙනුවෙන් අධිකාරියට උපචිතවන සියලු ආදායම්.

අධිකාරියේ මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

(2) අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ කිරීමේ දී අධිකාරි දරන ලද යම් වියදම් පියවීම සඳහා අවශ්‍යවන සියලු මුදල් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

23. (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය. මණ්ඩලය විසින් එක් එක් මුදල් වර්ෂ ස්වකීය ආදායම් සහ

වියදම් මෙන් ම අනෙකුත් සියලු ගනුදෙනු පිළිබඳ ව නිසි ගිණුම් පොත් පවත්වා ගැනීමට කටයුතු ස ලැබිය යුතු ය.

(2) ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි ව්‍යවස්ථාවේ විධි අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අධිකාරියේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) 1971 අංක 38 දරන මුදල් පනතේ II වැනි කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් ෑ අධිකාරියේ මූල්‍ය පාලනය සම්බන්ධයෙන් අදාල විය යුතු ය.

## *V වැනි කොටස*

### සාමාන්‍ය

අමාත්‍යවරයාගේ විධාන.

24. (1) අධිකාරියේ බලතල ක්‍රියාත්මක සහ කාර්ය ඉටුකිරීම සඳහා අමාත්‍යවරයා විසින් කලින්කල අධි වෙත සාමාන්‍ය හෝ විශේෂ විධිවිධාන නිකුත්කරනු ලැබිය හැකි අතර ඒ විධාන ඉටුකිරීම අධිකාරියේ කාර්ය යුතු ය.

(2) අධිකාරියේ දේපල, ව්‍යාපාර කටයුතු සහ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අමාත්‍යවරයාට අවශ් තොරතුරු ඉදිරිපත් කරන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරිය වෙත ලිඛිත විධාන නිකුත්කරනු ල හැකි අතර අධිකාරිය විසින් එවැනි සෑම නියෝගයකටම එකඟව ක්‍රියාකල යුතු ය.

නියෝග.

25. (1) මේ ප්‍රඥප්තිය මගින් නියමකර ඇති යම් කරුණක් සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට ප්‍රඥප්තිය මගින් බලය පවරා ඇති යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, නියෝග එසේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට හෝ එම නියෝගයේ නිශ්චිතව සඳහන් යම් පසු දිනයක ක්‍රියාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු හැකි ඉක්මනින් අනුමතය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත නොකරන ලද නියෝගයක් එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, එය යටතේ කලින් කරන කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දින පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

26. අධිකාරියේ සියලු ම අධ්‍යක්ෂවරුන්, නිලධරයන්, සේවකයන් සහ අනුයෝජිතයන් (19 වැනි අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ කාර්ය සඳහා හා එහි අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

*සියලු අධ්‍යක්ෂවරුන් ආදිය රජයේ නිලධරයන් විය යුතු බව.*

27. අධිකාරිය (26 වැනි අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගනු ලැබිය යුතු ය.

*අධිකාරිය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.*

28. (1) යම් අධිකරණයක් ඉදිරිපිට අධිකාරිය විසින් හෝ එයට එරෙහිව ගෙනු එනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය වෙත ගෙවන ලද යම් ගාස්තුවක් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

*අධිකාරිය විසින් දරන ලද වියදම් අයකර ගැනීම.*

(2) මේ ප්‍රඥප්තිය යටතේ හෝ අධිකාරියේ විධානය මත අධිකාරියේ යම් අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට එරෙහිව පවරනු ලැබූ සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක් ඒ ක්‍රියාව සිදුකර ඇත්තේ සද්භාවයෙන් බවට අධිකරණය තීරණය කරන්නේනම් සහ ඒ වියදම එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඒ තැනැත්තා විසින් අයකරගනු ලැබුවහොත් මිස, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

29. මේ ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද හෝ නිකුත්කරන ලද යම් නියෝග හෝ රීති උල්ලංඝනය කරන හෝ ඒ නියෝග හෝ රීතිවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැරහරින සෑම තැනැත්තෙකු ම වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී වරදකරු කරනු ලැබීමේ දී මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන්සීයක් නොඉක්මවන දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම ඔහු යටත් විය යුතු ය.

*මේ ප්‍රඥප්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීම වරදක් බව.*

30. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ ප්‍රඥප්තියේ –

"ආණ්ඩුකාරවරයා" යන්නෙන්, සබරගමුව පළාතේ ආණ්ඩුකාරවරයා අදහස් වේ ;

"අමාත්‍යවරයා" යන්නෙන්, සබරගමුව පළාත් සභාවේ අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ ;

"පළාත" යන්නෙන්, සබරගමුව පළාත අදහස් වේ ;

"පළාත් සභාව" යන්නෙන්, සබරගමුව පළාතේ පළාත් සභාව අදහස් වේ ;

"පළාත් රාජ්‍ය සේවය" යන්නෙන්, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වැනි වගන්තියේ දක්වා ඇති සබරගමුව පළාතේ පළාත් සභාවේ පළාත් රාජ්‍ය සේවය අදහස් වේ.

*අර්ථ නිරූපණය.*

31. (1) මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

*අනනුකූලතාවයක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.*

(2) මෙම ප්‍රඥප්තිය හා 1994 අංක 07 දරන පෙර පාසල් ප්‍රඥප්තිය අතර යම් පිළිගැටුමක් ඇතිවන අවස්ථාවක 2010 අංක 02 දරන මෙම ප්‍රඥප්තිය ඉහළින් සිටිය යුතු ය.

08-56

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

2 - PG 001161